## ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
## කොළඹ

## පුවත්පත් නිවේදනය

### <u>වැවිලි ක්ෂේත්‍රයේ තාරුණ්‍යය සවි බලගන්වමින් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය CEWET ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය සිසුන් 700ක් දක්වා පුළුල් කරයි</u>

ශ්‍රී ලංකාවේ වැවිලි ප්‍රජාවේ සාමාජීය සහ අධ්‍යාපනික සවි බලගැන්වීම සඳහා ඉන්දියාවේ අචල කැපවීම යළිත් තහවුරු කරමින්, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ලංකා වතු කම්කරු අධ්‍යාපන භාර (CEWET) ශිෂ්‍යත්ව පිරිනැමීමේ වැඩසටහන 2026 අගෝස්තු 10 වන දින කොළඹ, ටාජ් සමුද්‍රා හෝටලයේ දී පැවැත්විය. ලංකා වතු කම්කරු අධ්‍යාපන භාරය විසින් වසර 79ක් පුරා ජාතියට සිදු කළ මෙහෙය සමරමින් මෙම වැඩසටහන සඳහා වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍ය ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මැතිතුමා, ඉන්දීය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මැතිතුමා, නියෝජ්‍ය ඉන්දීය මහ කොමසාරිස්තුමා, CEWET කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් සහ ශිෂ්‍යත්වලාභී සිසු සිසුවියන් සහ ඔවුන්ගේ දෙමාපියන් ඇතුළු රැසක් සහභාගී වූහ.

2. ඉන්දීය උප ජනාධිපති අතිගරු ශ්‍රී සී. පී. රාධාක්‍රිෂ්ණන් මැතිතුමාගේ 2026 අප්‍රේල් ශ්‍රී ලංකා සංචාරය අතරතුර සිදු කරන ලද නිවේදනය පරිදි වැඩි දියුණු කරන ලද CEWET ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය නිල වශයෙන් ක්‍රියාවට නැංවීම උත්සවයේ කැපී පෙනෙන සිදුවීමක් විය. මෙම කැපවීම ශක්තිමත් කිරීම උදෙසා ඉන්දීය රජය විසින් වාර්ෂික ප්‍රතිලාභීන් සංඛ්‍යාව 350 සිට 700 දක්වා ඉහළ නැංවීමට සෘජුවම අවකාශ සලසමින් ඉන්දියානු රුපියල් මිලියන 200ක ප්‍රදානයක් CEWET අරමුදල සඳහා ලබා දෙන ලදී. මෙයට අමතරව උසස් පෙළ සිසුන් සඳහා මාසික ශිෂ්‍යාධාරය ශ්‍රී ලංකා රුපියල් 2,500 දක්වා ද උපාධි අපේක්ෂක සිසුන් සඳහා මාසික ශිෂ්‍යාධාරය ශ්‍රී ලංකා රුපියල් 7,500 දක්වා ද සැලකිය යුතු ලෙස ඉහළ නංවන ලද අතර ඒ අනුව වැවිලි ක්ෂේත්‍රයේ අවශ්‍යතා සහිත ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට අවැසි මූල්‍ය සහයෝගය සහතික කරන ලදී.

3. මෙම අවස්ථාව අමතමින් මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව ගැඹුරු ශිෂ්ටාචාරමය බැඳීම් බෙදා හදා ගන්නා බව ද ඉන්දීය සම්භවයක් සහිත දෙමළ ප්‍රජාව දෙරට අතර වැදගත් ජීවමාන පාලමක් වන බව ද ප්‍රකාශ කළේය. දැනුම විනාශ කළ නොහැකි වත්කමක් බව අවධාරණය කළ මහ කොමසාරිස්තුමා ඉන්දියානු රුපියල් කෝටි 75ක පුළුල් පැකේජයක් යටතේ විවිධ අධ්‍යාපනික සහය ලබා දෙන බව

පෙන්වා දුන්නේය. STEM විෂයන් උගන්වන ගුරුවරුන් 2,000කට වැඩි සංඛ්‍යාවකට පුහුණුව ලබා දීම, සිසු සිසුවියන් 10,000කට අධික පිරිසකට ඉගෙනුම් ද්‍රව්‍ය ලබා ලීම, වතුකර පාසල් 9ක යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සහ සුහුරු පන්ති කාමර 60ක් ස්ථාපනය කිරීම යනාදිය මෙයට ඇතුළත් වේ.

4. ගරු නියෝජ්‍ය අමාත්‍ය සුන්දරලිංගම් ප්‍රදීප් මැතිතුමා ද අදහස් දැක්වූ අතර එහිදී එතුමා අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා සහ ඉන්දීය රජය විසින් ලබා දෙන අචල සහයෝගයට සිය හද පිරි කෘතවේදිත්වය පළ කළේය. දෙරට අතර පවතින්නේ සහෝදර බැඳීමක් බව ද එතුමා සඳහන් කළේය. මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමාගේ ක්‍රියාශීලී කැපවීම අගය කළ නියෝජ්‍ය අමාත්‍යතුමා අධ්‍යාපනය සඳහා අයෝජනය කිරීම දිගු කාලීන ප්‍රජා සංවර්ධනය උදෙසා හේතු වන බව ද අධ්‍යාපනය ඓතිහාසික වශයෙන් පවතින අවාසි ජය ගැනීමට, පසුගාමිත්වයේ බාධක බිඳ දැමීමට සහ සමාජ සමානාත්මතාවය සුරක්ෂිත කිරීමට වඩාත්ම ඵලදායි මෙවලම වන බව ද ප්‍රකාශ කළේය.

5. මෙම වැඩසටහන ICCR ශිෂ්‍යත්ව, ITEC වෘත්තීය පුහුණු අවස්ථා සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් වැනි පුළුල් පරාසයක මානව සම්පත් සංවර්ධන මුලපිරීම් හරහා ක්‍රියාත්මක සමීප ශ්‍රී ලංකා-ඉන්දියා අධ්‍යාපනික සහයෝගීතාවය වඩාත් අර්ථාන්විත කරමින් එයට තවත් පරිච්ඡේදයක් එක් කළේය.

***

**කොළඹ**
***2026* අගෝස්තු *14***